# කෙයා ෆෝ ද බ්‍රේව් (නිර්භීතත්වය රැකබලාගැනීම)

පූර්ණ ආබාධිත තත්වයට පත් වී සිටින රණවිරුවන් ජීවිත කාලය පුරාම රැකබලා ගැනීම උදෙසා ඉදිකරන "රණවිරු සුභසාධන නිකේතන" ව්‍යාපෘතිය *"බ්‍රේව් හාට්ස්"*, යුද්ධ හමුදාපති ලුතිතන් ජෙනරාල් ජගත් ජයසූරිය මහතාගේ මගපෙන්වීම මත යුද හමුදා සේවා වනිතා ශාඛාව මගින් දියත් කොට ඇත.

## මෙහෙය

පූර්ණ ආබාධිත තත්වයට පත් වූ රණවිරුවන් ජීවිත කාලය පුරා රැක බලා ගැනීම.

## පසුබිම

වර්තමානය වන විට මෙසේ විවිධාකාරයෙන් පූර්ණ ආබාධිත තත්වයට පත් ව සිටින සෙබළු 300ක් පමණ සිටිති. මොවුන් අතර කොඳු ඇටය බිඳී ගිය, මොළයට හානි වූ, අවයව විභග්න වූ, දෘශ්‍යාබාධිත, ශ්‍රව්‍යාබාධිත, කථන දෝෂ සහිත, අවයව අකර්මන්‍ය වූ හා වෙනත් විවිධාකාරයෙන් ආබාධිත තත්වයට පත්වූ සෙබළුන් සිටිති.

යෞවනයේ මුල් අවධියේ සිටින මොවුන්ට ජීවිත කාලය පුරාම ආබාධිත තත්වයෙන්ම ජීවත්වීමට සිදුවී තිබේ. තවද මොවුන් රෝදපුටුවලට හා ඇඳටම සීමා වී සිටින තත්වයේ ද පසුවන බැවින් ඒ ඒ ආබාධ තත්වයන්ට ගැලපෙන ලෙස සත්කාර කිරීමට සිදුවී ඇත. එසේම කරනු ලබන ප්‍රතිකාර හා සත්කාර ඔවුන්ගේ ඉදිරි ජීවත්වීම සඳහා වැදගත් වුවද තම නිවෙස්වල දී එම සත්කාර ලබාගැනීමට අවැසි පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා අපේක්ෂිත අරමුණු ඉටු නොවේ. ඇතැමුන්ට විශේෂඥ සත්කාරක සේවා ලබාගැනීමට අවශ්‍ය වුවද, ඊට ඔවුන්ගේ ජීවන මට්ටම හරස් වී ඇත. තවද බොහෝ ආබාධිත සෙබළු ඉතා දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන අතර, මූලික පහසුකම් ද නොමැත. සමහරෙකුට අත්‍යාවශ්‍ය අවශ්‍යතාවයක් වන නිවාස පහසුකම් ද නොමැත.

රටේ උන්නතිය වෙනුවෙන් විශාල කැපකිරීමක් කළ මෙම විශේෂ පිරිස ඔවුන්ගේ ඒ අතීත අත්දැකීම්වල බිහිසුණු මතක සටහන්වලින් තවමත් මිදී නැත. එම බිහිසුණු මතක සටහන් සමගින් ඔවුන් අදටත් ජීවත් වෙති.

## පරමාර්ථ

- පූර්ණ ආබාධිත තත්වයට පත්වූ රණවිරුවගේ ගෞරවය හා අභිමානය සුරැකීම
- ජීවිත කාලය පුරා අවශ්‍ය වෛද්‍ය පහසුකම් ලබාදිම
- සැප පහසුකම් සහිත පරිසරයක් ඔවුන්ට ලබාදීම.
- රැකවරණය, ආදරය සහ අමතක නොකිරීම පිරුනු තැනක් බිහි කිරීම.
- ඔවුන්ගේ කැපකිරීම අප අමතක නොකල බව ඔවුන්ට මතක් කර දීම.
- දිනෙන් දින ආතතියට පත්වන තම පවුල්වලට සහනය සැලසීම.
- ඔවුන්ගේ මානසික සුවය සහ හැකියාව වර්ධනය කිරීම.
- තම ප්‍රතිචාර මෙන්ම විනෝදාශ්වාදයට අවස්ථාවක් ලබාදීම.
- ඔවුන්ට බලාපොරොත්තුවක් හා විශ්වාසයක් ඇති කිරීම.
- මෙය ඔවුන්ගේ යැයි හැඟීමක් ඇති කිරීම.

## යෝජිත ආකෘතිය

වීරෝදාර රණවිරුවන්ට අවශ්‍ය සියළු පහසුකම්වලින් යුත් නිකේතන ආකාරයෙන් සුබසාධන මධ්‍යස්ථාන ඉදි කිරීමට නියමිතය. මෙහි පළමු අදියර යටතේ රුපියල් මිලියන 200ක් වැය කොට අනුරාධපුර, නුවරවැව ආශ්‍රිතව ඉදි කෙරෙන නිවාඩු නිකේතනය තුලින් රණවිරුවන් 50 දෙනෙකුට නවාතැන් පහසුකම් සැපයේ. පසුව ප්‍රාදේශීය මට්ටමින් ද මෙවැනි තවත් සුභසාධන මධ්‍යස්ථාන ඉදිකිරීමට සැලසුම් කොට ඇත.

## මෙම මධ්‍යස්ථානයේ පහසුකම්

පරිපාලන මධ්‍යස්ථානයක්, සියළු පහසුකම් සහිත අමුත්තන් සඳහා වෙන් වූ මධ්‍යස්ථානයක්, ඇඳටම සීමා වී සිටින රණවිරුවන්ගේ පහසුව සඳහා (මොලයේ සහ සුශුම්නාවේ ආබාධ සහිත ) (එක් නිවසකට ඇඳන් 04ක් බැගින් සහ රූපවාහිනී පහසුකම් සහිත නිවාස 08ක්) මොලයට හානි වූ, සුශුම්නාවේ ආබාධ සහිත, අවයව අකර්මන්‍ය වූ වැනි ආබාධිත තත්වයන්ට පත්වූ රණවිරුවන් සඳහා (එක් නිවසකට ඇඳන් 02 බැගින් යුත් සිවු දෙනෙකුට නවාතැන් පහසුකම් ලබා ගත හැකි නිවාස 05ක්) භෞතික චිකිත්සාව / ජල චිකිත්සාව /උපදේශන මධ්‍යස්ථාන / ආයුර්වේද ප්‍රතිකාර, පරීක්ෂණාගාර, පුස්තකාල පහසුකම් සහිත විනෝද ක්‍රීඩා ස්ථාන, සිනමා, ඔසු උයන්, ආගමික ස්ථාන, සංගීත කාමර, ක්‍රීඩා පහසුකම් ආදියට අමතරව ගෘහ පාලන ඒකකයක් සහ මුළුතැන් ගෙයක්, වෛද්‍ය/ හෙද/ නිලධාරී හා සුළු සේවකයින් සඳහා නිල නිවාස ආදිය මෙයට ඇතුලත් වේ.

මෙම උදාර කර්තව්‍යයට මහජනතාවට, විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට, විවිධ සංවිධානවල සාමාජිකයන්ට සහ සුභසාධන කටයුතුවලට උපකාර කරන දානපතීන්ට තම පරිත්‍යාග සිදු කළ හැක. මෙම කර්තව්‍යයට උපකාර කිරීමට කැමති අනුග්‍රාහකයින්ට සිදුකරන ඉදිකිරීම් කටයුතුවල දී ඉන් කොටසක් ඉදිකරදීමට හෝ මුදලින් පරිත්‍යාගයක් සිදුකිරීමට හැක. (තුවාල ලත් සෙබළුන් සිව් දෙනෙකුට සත්කාරක නිවසක් හෝ භෞතික චිකිත්සක ඒකකයක් හෝ ඉදිකරදීමට හැකිවීම නිදසුන් ලෙස දැක්විය හැක.) එහිදී තමා ඉදිකර දෙන කොටසට තම නම යෙදීමට අනුග්‍රාහකයින්ට අවස්ථාව ලබා දී ඇත. මේ සඳහා වන ආධාර ***ලංකා බැංකුවේ*** විවෘත කොට ඇති විශේෂ ගිණුමට බැර කළ හැක. මුදල් පරිත්‍යාග කිරීම සඳහා:

ලංකා බැංකු ලිපිනය : ඩී.ආර් විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකා

ශාඛාව : ලේක් හවුස් ශාඛාව

ගිණුමේ නම : "බ්‍රේව් හාර්ට්ස්"

ගිණුම් අංකය : 9846026

දුරකථන අංක : 0112-343953 / 0112-541404

ෆැක්ස් : 0112-343953

විද්‍යුත් ලිපිනය : sevavanitha@mail.army.lk./ sevavanitha@yahoo.com

වෙබ් අඩවිය : www.army.lk/sevavanitha

ව්‍යාපෘතියේ ප්‍රගතිය හා අරමුදල් තත්වය විශේෂ වෙබ් පිටුවක නිරන්තරයෙන් යාවත්කාලීන වේ. එම වෙබ් පිටුව www.army.lk/sevavanitha වෙබ් අඩවිය හා ජාල ගත කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා වාර්ෂිකව විගණනයක් සිදුවන අතර එම වාර්තාව ද වෙබ් අඩවියේ පලකරනු ලැබේ. සේවා වනිතා යුද හමුදා ශාඛාව මගින් මෙම ක්ෂේත්‍රයන් පිළිබඳ විශේෂඥ දැනුමක් හා පුළුල් අත්දැකීම් ඇති පරිබාහිර පුද්ගලයන් මෙහි උපදේශක මණ්ඩලයට පත්කරනු ලබයි.

## පවත්වාගෙන යාම

- සුභසාධන නිකේතනයේ පූර්ණ හිමිකාරීත්වය සහ කළමණාකරණය ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සතුවේ. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ යුද්ධ හමුදාපති විසින් පත්කළ විධායක කමිටුවක් මගින් මෙම ව්‍යාපෘතිය පාලනය වේ.

මේ පිළිබඳ වැඩි විස්තර ලබා ගැනිමට අමතන්න:


බ්‍රේවි හාර්ට්ස්<br>
සේවා වනිතා යුද හමුදා ශාඛාව<br>
ශ්‍රී ලංකා යුද හමුදා මුලස්ථානය<br>
තැ.පෙ. 553, බාල දක්ෂ මාවත,<br>
කොළඹ 03, ශ්‍රී ලංකා.

| | |
|---|---|
| දුරකථන අංක | : 0112-343953 / 0112-541404 |
| ෆැක්ස් | : 0112-343953 |
| විද්‍යුත් ලිපිනය | : sevavanitha@mail.army.lk./ sevavanitha@yahoo.com |
| වෙබ් අඩවිය | : www.army.lk/sevavanitha |